3 වන පිටෙන්

ඉදිරියට ශිෂ්‍යන් ත්‍රස්තවාදීන්යි, ශිෂ්‍යන් දේශද්‍රෝහීන්යි යන ලේබල් අලවා පෙරට ගෙන එන්නේ අන්‍ය ආකාරයකින් සරසවි සිසුවා හිරකිරීමට ය. සරසවි සිසුවාගේ අතපය බැඳදැමීමට අධ්‍යාපන පුද්ගලීකරණය, අනවශ්‍ය රැකියා තරගය, රැකියා වෙළඳපොල තුල මාෆියා නිර්මාණය සහ සමාජ ප්‍රශ්න මත සරසවි සිසුවා නිශ්ක්‍රීය කිරීමට උත්සහ ගන්නා බව පැහැදිලි කරුණකි. ඒ ආකාරයෙන් එක් අන්තයක සරසවි සිසුන් යම්තාක් දුරට අඩපණ කර ඇත.

අනෙක් අන්තයේ මහජනතාව අසරණ කර ඇත්තේ මාධ්‍ය සංදර්ශන සහ මැතිවරණ මගින්ය. මාධ්‍ය සංදර්ශන මගින් ජනතාවට ප්‍රශ්න අමතක කිරීමටත් සැබෑ ප්‍රශ්න යටගසා සිදුකරයි.

ප්‍රශ්න පත්‍රවල ගැටළු, ඉසෙඩ් ලකුණු ගැටළු, ගුරු සංගම් වර්ජන, අධ්‍යාපන ප්‍රතිපාදන කප්පාදුව, සරසවි සිසුන් මර්ධනය වැනි ව්‍යාපෘති ගණනාවක් තුලින් පාලන තන්ත්‍රයේ ලොක්කන්ට වැයත් නැති අයත් නැති රාජ්‍ය අධ්‍යාපනය වෙනුවට වැය නැති යහමින් අය ඇති පුද්ගලික අධ්‍යාපනය විකල්පයක් ලෙස ඉදිරිපත් කිරීමට සැරසීම විශාල ගැටළුවකි. දැන් රටට පෙන්වීමට උත්සහ කරන්නේ රාජ්‍ය අධ්‍යාපනය පුස්සක් සහ වටිනාකමක් නැති දෙයක් ලෙස සහ පුද්ගලික අධ්‍යාපනය ස්වර්ග රාජ්‍යයක් ලෙසය. මෙහි සත්‍ය තත්වය සිහිනුවණින් මෙරට ජනතාව වටහා නොගනීනම් අනාගතය මෙන්ම වර්තමානයද



STF *නව යුගයට නව අවි - පෙළපාලිකරුවන්ට පහර දීම සඳහා ගල් සහ අලවංගු*

නැති සැප මතුකිරීමටත් කටයුතු කරමින් පවතී. මහජනයා නිශ්ක්‍රීයව නිහඬව ගමන්කරයි. ඔවුන් සමාන කළ හැක්කේ ක්ෂේම භූමියක් ප්‍රාර්ථනා කරමින් සෙක්කුව වටා ඇවිදින තඩි ගොන් නාම්බන් රැළක් ලෙසය. අනෙක් අන්තයේ සමාජ ව්‍යාපාර අඩපණ කර ඇත්තේ ඒවා තුල දෙදරීම් සහ මත ගැටුම් නිර්මාණය කිරීමට චරපුරුෂයන් සහ මුදල් මත යැපෙන බඩගෝස්තරවාදීන් ඒවාට රිංගවීම මගින්ය. මෙසේ අධ්‍යාපනය සුරැකීමේ ගාමක බලවේග ප්‍රධාන මාර්ගය තුල අසරණ කර පාලන තන්ත්‍රය හොර පාරෙන් රාජ්‍ය අධ්‍යාපනය වලපල්ලට ගෙනයාම නන්නත්තාර වීම වලක්වාගත නොහැකිය. ඒ පවට පොදුවේ කරගැසීමට සිදුවනු ඇත.

මේ අධ්‍යාපන පාලකයින්ගේ නාස්ලණු දමා තද නොකලහොත් නුදුරු අනාගතයේදී අධ්‍යාපනය නැමති මහා පුරුෂයාට මේ බඩගෝස්තරවාදීන් ප්‍රසිද්ධියේ වෙඩිතබා මරා දමනු ඇත. ඉන්පසුව මාධ්‍ය ඉදිරියේ හුරුබුහුටි සහ ඉතා අවිහිංසක ලෙස **අපට කිසිවක් මතක නැත** යනුවෙන් කියනු නොඅනුමානය.

Master Tutoring Academy
"Your success is our satisfaction"
**Master Tutoring Academy**
**මාස්ටර් ටියුටරින්**
**පැයකට ඩොලර් 10**
**බජට් පැකේජය සමග**
Dandenong **වලට**
**පිවිසෙන වගයි !!!**

සංවිධානය
**නිහාල් කොඩිකාර**

**වැඩි විස්තර**
**0425 403 105**
**0430 635 335**

**3 4 5 පන්ති සඳහා**

## සන්නස Cartoon by PK










PK ගේ කාටුන් රසවිඳින්නට දිනපතා www.sannasa.net අඩවියට ගොඩවන්න

**සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න**
03 8707 4604 / 0402 025 516
**email** sannasanews@gmail.com ads.sannasa@gmail.com